# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2022.03.16

වර්ෂ 2022 ක් වූ මාර්තු මස 16 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ මාර්තු මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
06. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
08. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
10. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
11. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ඃ-**

**01. 2022-02-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2022-02-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2022-02-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

(පෙ.ව 09.35ට ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා, පෙ.ව 09.40ට ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා, පෙ.ව 09.43ට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා, පෙ.ව 09.45ට ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා, පෙ.ව 09.48ට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය, පෙ.ව 09.50ට ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය, පෙ.ව 10.10ට ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා, පෙ.ව 10.12ට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදු විය.)

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් 2022-02-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාවේ 11 පිටුවේ සඳහන් "මෙම මාර්ගය සංවර්ධනය කිරීමෙන් පසු ගමනාගමන කටයුතු වලට අවහිරතා මතු වී ඇති බවත්," ලෙස සඳහන් වීම තමා විසින් සිදු නොකරන ලද ප්‍රකාශයක් බැවින් එම වාක්‍යය මහා සභා රැස්වීම් වාර්තාවෙන් ඉවත් කොට සංශෝධනය කරන ලෙස ඉල්ලීම් කරන ලදී.

ගරු මන්ත්‍රී ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් 2022-02-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාවේ 11 පිටුවේ සඳහන් "මේ සඳහා අමරසේන මහතා විසින් භූමිය ලබා දීමට එකඟතාවය ලබා දී ඇති බවට විසින් ප්‍රකාශ කරන ලදී." මෙම ප්‍රකාශය තමා විසින් කරන ලද ප්‍රකාශයක් බවට වාර්තාවේ සඳහන් වුවද එය ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් කරන ලද ප්‍රකාශයක් බැවින් මෙම ප්‍රකාශය ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් කරන ලද ප්‍රකාශයක් ලෙස සංශෝධනය කරන ලෙස ඉල්ලීම් කරන ලදී.

(පෙ.ව 10.30ට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදු විය.)

ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් විසින් 2022-02-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාවේ 09 පිටුවේ සඳහන් " මෙම යෝජනාව මීට පෙර සභා වාරයකදී තමා විසින් ඉදිරිපත් කරන ලද චෝදනාවක් බවත් " මෙම ප්‍රකාශය " මෙම යෝජනාව මීට පෙර සභා වාරයකදී තමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් බවත් " ලෙස සංශෝධනය කරන ලෙස ඉල්ලීම් කරන ලදී.

(පෙ.ව 10.36ට ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සහ පෙ.ව 10.50 ට ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

සභා වර්තාව සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම මගින් ගරු සභිකවරුන්ගේ අදහස් දැක්වීම් යටපත්වීම සිදුවන බවට ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභා වාර්තාවට විරුද්ධ විය.

2022-02-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඉහත සංශෝධනවලට යටත්ව බහුතරයෙන් සභා සම්මත විය.

(පෙ.ව 10. 55ට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදු විය.)

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන ඃ- නැත**

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** හපුගල, මවුන්ට් ප්ලසන්ට් වත්තේ සමන් මහතාගේ නිවස අසළ මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව හපුගල, මවුන්ට් ප්ලසන්ට් වත්තේ සමන් මහතාගේ නිවස අසළ මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.** හපුගල, යුනිවර්ල් සිටි, ගුණසේකර මහතාගේ නිවස අසළ මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

හපුගල, යුනිවර්ල් සිටි, ගුණසේකර මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට ලෙස මෙම යෝජනාව සඳහා සංශෝධනයක් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

එම සංශෝධනය ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී සංශෝධිත යෝජනාවට අදාළව හපුගල, යුනිවර්ල් සිටි, ගුණසේකර මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**03.** සිට්ට්‍රස් වත්තේ ඉදිකරනු ලබන ආදාහනාගාරයේ ජල අවශ්‍යතාවයන් සඳහා සභා අරමුදලින් ළිඳක් කැපීමටත්, ජල ටැංකිය තැබීම සඳහා ආධාරක කුළුණක් ඉදිකිරීමටත්, ජල ටැංකියක් සහ ජල මෝටරයක් මිලදී ගැනීමටත්, මේ සඳහා අවශ්‍ය අනෙකුත් ජල නල හා උපාංග මිලදී ගැනීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ආදාහනාගාරය සඳහා ජල සම්පාදන මණ්ඩලය හරහා නල ජලය ලබා ගැනීමට හැකියාවක් තිබේද යනුවෙන් සොයා බලන ලෙස ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

සිට්ට්‍රස් වත්ත අවට ප්‍රදේශවල ගම්වාසීන් ජල අවශ්‍යතාවය සපුරා ගනු ලබන්නේ ළිං ජලයෙන් බවත්, ජල සම්පාදන මණ්ඩලය හරහා මෙම ස්ථානයට නල ජලය ලබා ගැනීමට නොහැකි බවට දැනුම් දී ඇති බවත්, දැනට මෙම ස්ථානයේ ළිඳක් ඇති බවත්, එම ළිඳ අළුත්වැඩියා කොට භාවිතයට ගැනීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

භූගත ජලය අපිරිසිදු වී ඇති බැවින් පරීක්ෂා කිරීමකින් පසු භාවිතයට ගැනීමට සුදුසු බවත්, වැඩි පිරිවැයක් වැය වුවද මෙම ස්ථානයට නල ජලය ලබා ගැනීම සුදුසු බවත්, මෙම ස්ථානයට නල ජලය ලබා ගැනීම සඳහා වැයවන පිරිවැය පිළිබඳව සොයා බලා ඒ පිළිබඳව අදහසක් ලබා ගන්නා ලෙසත්, සිට්ට්‍රස්වත්තේ පදිංචි ජනතාව වෙතද ජලය ලබා ගැනීම සම්බන්ධව ගැටළු ඇති බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සිට්ට්‍රස් වතුයායේ කටයුතු සඳහාද ජලය ලබා ගනු ලබන්නේ ළිඳකින් බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ජල ටැංකිය ස්ථාපිත කිරීමට කුළුණක් ඉදිකිරීමට පෙර මෙම ස්ථානයේ ඇති ළිඳ පිරිසිදු කොට එහි ජල සාම්පලයක් ලබාගෙන ජල සම්පාදන මණ්ඩලයේ රසායනාගාරය හරහා පරීක්ෂා කොට වාර්තාවක් ලබා ගන්නා ලෙසත්, ළිං ජලයෙහි තත්ත්වය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට පෙර ජල ටැංකිය ස්ථාපිත කිරීමට කුළුණක් ඉදිකිරීමෙන් වළකින ලෙසත්, මෙම ස්ථානය සඳහා ජල සම්පාදන මණ්ඩලය හරහා හෝ පෞද්ගලික අංශය හරහා නල ළිඳක් ඉදිකිරීමට හැකියාවක් ඇති බවත්, මෙම ස්ථානය වෙත ජල සම්පාදන මණ්ඩලය හරහා නල ජලය ලබා ගැනීමට යාමේදී විශාල පිරිවැයක් දැරීමට සිදුවන බවත් ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ආදාහනාගාරය ඉදිකිරීමේ ටෙන්ඩර් ක්‍රමයට තමාගේ විරෝධතාවයක් ඇති බවත්, මෙම කාර්යය ආදාහනාගාරයේ ඉදිකිරීමෙන් පසු සිදු කළ යුතු කාර්යයක් බවත්, එබැවින් මෙම යෝජනාවට තමා විරුද්ධ වන බවත්, ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ආදාහනාගාරයේ ඉදිකිරීම් කටයුතු සඳහා ජලය හා විදුලිය අප ප්‍රාදේශීය සභාව හරහා සම්පාදනය කළ යුතු බවට ගිවිසුමේ අන්තර්ගත වන්නේ දැයි ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

අදාහනාගාරයේ වැඩ කටයුතු සඳහා සේවකයන් සිවුදෙනෙකු බඳවා ගැනීමට යෝජිත බවත්, එම සේවකයන්ගේ භාවිතයට සහ ආදහනාගාරයේ අවශ්‍යතා සඳහා මෙම කාර්යය සිදු කරන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සිට්ට්‍රස් වත්තේ ඉදිකරනු ලබන්නේ ද්විත්ව කුටීර ආදාහනාගාරයක් බවත්, අප්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ දුම අවම කිරීම සඳහා සහ දුමේ විෂ අවම කිරීම සඳහා ජලය ස්ප්‍රේ කිරීම සිදු කළ යුතු බවත්, එබැවින් මෙම ආදාහනාගාරයේ ක්‍රියාකාරීත්වය සඳහා ජලය අත්‍යාවශ්‍ය බවත්, මෙම ආදාහනාගාරය ඉදිකරනු ලබන භූමිය පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඇතැම් මන්ත්‍රීවරු නොදන්නා බවත්, ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ආදාහනාගාරය ඉදිකරනු ලබන භූමිය පිහිටි ස්ථානය ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා පවා නොදන්නා බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා මෙම ස්ථානය පිළිබඳව අවබෝධයක් නොමැතිව භූගත ජලයේ විෂමතාවයන් පිළිබඳව අදහස් දක්වන බවත්, ආදාහනාගාරය ඉදිකරන භූමිය රබර් වතු යායකින් වටවී ඇති රතු පස් සහිත භූමියක් බවත්, ආදාහනාගාරයේ වැඩකටයුතු සඳහා නල ජලය භාවිතයට ගතහොත් ජල කප්පාදුවක් සිදුකළ අවස්ථාවකදී ආදාහනාගාරයේ වැඩකටයුතු සඳහා බාධා මතුවන බවත්, මෙම ස්ථානයේ ඉදිකරන ළිඳ සිලින්ඩර් යොදා සංවර්ධනය කළ යුතු බවත් ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ප්‍රකාශ කළ පරිදි ළිං ජලයේ සාම්පල් පරීක්ෂාවක් සිදු කළ යුතු බවත්, පානීය අවශ්‍යතා සඳහා, භූමි අලංකරණ කටයුතු සඳහා, සේවක අවශ්‍යතා සඳහා මෙන්ම අදාහනාගාරයේ කටයුතු සඳහා ජල අවශ්‍යතාවය පවතින බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව බහුතරයෙන් සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව සිට්ටුස් වත්තේ ඉදිකරනු ලබන ආදාහනාගාරයේ ජල අවශ්‍යතාවයන් සඳහා සභා අරමුදලින් ළිඳක් කැපීමටත්, ජල ටැංකිය තැබීම සඳහා ආධාරක කුළුණක් ඉදිකිරීමටත්, ජල ටැංකියක් සහ ජල මෝටරයක් මිලදී ගැනීමටත්, මේ සඳහා අවශ්‍ය අනෙකුත් ජල නල හා උපාංග මිලදී ගැනීමටත් මහා සභාව විසින් බහුතරයෙන් සභා සම්මත කරන ලදී.

(පෙ.ව 11.20ට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**04.** සිට්ටුස් වත්තේ අදාහනාගාරය ඉදිකරනු ලබන භූමියේ ආරක්ෂක පැති බැම්ම ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව සිට්ටුස් වත්තේ අදාහනාගාරය ඉදිකරනු ලබන භූමියේ ආරක්ෂක පැති බැම්ම ඉදිකිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**05.** සිට්ටුස් වත්තේ අදාහනාගාරය ඉදිකරනු ලබන භූමියේ භූමි අලංකරණ කටයුතු සිදුකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාහනාගාරයේ ඉදිරිපස වැටි බැඳ මල් පැල සිටුවීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව සිට්ටුස් වත්තේ අදාහනාගාරය ඉදිකරනු ලබන භූමියේ භූමි අලංකරණ කටයුතු සිදුකිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**06.** සිට්ටුස් වත්තේ ඉදිකරනු ලබන ආදාහනාගාරය සඳහා විදුලි බලය ලබාදීමට ලංකා විදුලි බල මණ්ඩලය ඉදිරිපත් කොට ඇති රු.353,323.20ක ඇස්තමේන්තුගත මුදල ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව සිට්ටුස් වත්තේ ඉදිකරනු ලබන ආදාහනාගාරය සඳහා විදුලි බලය ලබාදීමට ලංකා විදුලි බල මණ්ඩලය ඉදිරිපත් කොට ඇති රු.353,323.20ක ඇස්තමේන්තුගත මුදල ගෙවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**07.** සභාවේ රාජකාරි ලිපිගොනු සුරක්ෂිතව තැබීම සඳහා වානේ අල්මාරියක් මිලදී ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව සභාවේ රාජකාරි ලිපිගොනු සුරක්ෂිතව තැබීම සඳහා වානේ අල්මාරියක් මිලදී ගැනීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**08.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනනය වන කසළ කළමනාකරණය සඳහා සුදුසු ව්‍යාපෘතියක් සකස්කර ඇස්තමේන්තු සමග ඉදිරිපත් කරන ලෙස පිළිගත් ආයතන වලින් මිල ගණන් කැඳවීමටත්, එම ව්‍යාපෘති වාර්තා සකස්කිරීම, උපදේශන සහ අධීක්ෂණ කටයුතු සහ ඇස්තමේන්තු ඇගයීම් ක්‍රියාවලිය සඳහා පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුව සහ නර්ඩ් ආයතනය සහභාගිකර ගැනීමටත්, මෙම ව්‍යාපෘතිය පෝද්දල සුසාන භූමිය සඳහා වෙන්කර ඇති ඉඩමේ හෝ වටරැක කොඩිතුවක්කු ගාර්ඩන්ස් වෙන්දේසි ඉඩමේ පොදු පහසුකම් සඳහා වෙන්කොට ඇති ඉඩමේ හෝ සභාව සතු වෙනත් සුදුසු ඉඩමක ස්ථාපිත කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර ඇති බැවින් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සහ නර්ඩ් ආයතනයෙන් විමසීම් කොට ව්‍යාපෘතියක් සකස්කොට පුවත්පත් දැන්වීම් පලකොට ටෙන්ඩර් කැඳවා අවශ්‍ය කටයුතු සිදුකිරීමට මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, මෙම ව්‍යාපෘතිය සිදුකරගෙන යාමේදී වුවද බාධා මතුවිය හැකි බවත්, එම නිසා සහයෝගයෙන් මෙම කාර්යය සිදු කිරීමට බලාපොරොත්තු වන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනනය වන කසළ කළමනාකරණය සඳහා සුදුසු ව්‍යාපෘතියක් සකස්කර ඇස්තමේන්තු සමග ඉදිරිපත් කරන ලෙස පිළිගත් ආයතන වලින් මිල ගණන් කැඳවීමටත්, එම ව්‍යාපෘති වාර්තා සකස්කිරීම, උපදේශන සහ අධීක්ෂණ කටයුතු සහ ඇස්තමේන්තු ඇගයීම් ක්‍රියාවලිය සඳහා පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුව සහ නර්ඩ් ආයතනය සහභාගිකර ගැනීමටත්, මෙම ව්‍යාපෘතිය පෝද්දල සුසාන භූමිය සඳහා වෙන්කර ඇති ඉඩමේ හෝ වටරැක කොඩිතුවක්කු ගාර්ඩන්ස් වෙන්දේසි ඉඩමේ පොදු පහසුකම් සඳහා වෙන්කොට ඇති ඉඩමේ හෝ සභාව සතු වෙනත් සුදුසු ඉඩමක ස්ථාපිත කිරීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**09.** ප්‍රාදේශීය සභා මගින් සිදු කරනු ලබන වීදි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය සභා වෙත ගෙවීම් කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය වෙත ප්‍රතිපාදන නොලැබෙන බවට දැනුම් දී ඇති බැවින් වීදි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් 2021 වර්ෂය සඳහා ලංකා විදුලි බල මණ්ඩලය වෙතින් අප ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු රු.286,247.00ක මුදල පොත් වලින් කපා හැරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මුදල් පසුගිය වර්ෂයේ සිට වෙන් නොවන බවට ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැනුම් දී ඇති බැවින් මෙම මුදල් පොත් වලින් කපා හැරීමට යෝජනා කළ බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ප්‍රාදේශීය සභා මගින් සිදු කරනු ලබන වීදි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය සභා වෙත ගෙවීම් කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය වෙත ප්‍රතිපාදන නොලැබෙන බවට දැනුම් දී ඇති බැවින් වීදි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් 2021 වර්ෂය සඳහා ලංකා විදුලි බල මණ්ඩලය වෙතින් අප ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු රු.286,247.00ක මුදල පොත් වලින් කපා හැරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**10.** ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා නව මාසික බදු කුලී තක්සේරුවක් සිදුකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා නව මාසික බදු කුලී තක්සේරුවක් සිදුකිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**11.** සිට්ට්‍රස් වත්තේ ඉදිකරනු ලබන ආදාහනාගාරය භූමියෙන් කපා ඉවත් කරන පස් සහ කළුගල් නාරාවල ශ්‍රී සුදර්ශනාරාමයේ ආදාහන මළුව පුළුල් කිරීමේ කටයුතු සඳහා මුදල් අයකර ගැනීමකින් තොරව ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සිට්ට්‍රස් වත්තේ ඉදිකරනු ලබන ආදාහනාගාරය භූමියෙන් කපා ඉවත් කරන පස් සහ කළුගල් නාරාවල ශ්‍රී සුදර්ශනාරාමයේ ආදාහන මළුව පුළුල් කිරීමේ කටයුතු සහ ගමට පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා මුදල් අයකර ගැනීමකින් තොරව ලබා දීමට ලෙස මෙම යෝජනාව සඳහා සංශෝධනයක් ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

එම සංශෝධනය ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම පස් යොදාගෙන ලබුදූව පොදු ක්‍රීඩාංගනය සංවර්ධනය කරන අතරතුර මෙම කාර්යයද සිදු කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** ඃ- එකී සංශෝධිත යෝජනාවට අදාළව සිට්ට්‍රස් වත්තේ ඉදිකරනු ලබන ආදාහනාගාරය භූමියෙන් කපා ඉවත් කරන පස් සහ කළුගල් නාරාවල ශ්‍රී සුදර්ශනාරාමයේ ආදාහන මළුව පුළුල් කිරීමේ කටයුතු සහ ගමට පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා මුදල් අයකර ගැනීමකින් තොරව ලබා දීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**12.** නාරාවල ශ්‍රී සුදර්ශනාරාමයේ ආදාහන මළුව හරහා භාවිතා වන මාර්ගයේ පිවිසුම වෙත අඩි දෙකක විශ්කම්භය ඇති අඩි අටක් දිග සිලින්ඩර් දෙකක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** ඃ- එකී යෝජනාවට අදාළව නාරාවල ශ්‍රී සුදර්ශනාරාමයේ ආදාහන මළුව හරහා භාවිතා වන මාර්ගයේ පිවිසුම වෙත අඩි දෙකක විශ්කම්භය ඇති අඩි අටක් දිග සිලින්ඩර් දෙකක් යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**13.** CA/Writ/622/2021 අංක දරණ ගිංතොට ප්ලයිවුඩ් ආයතනය විසින් අභියාචනාධිකරණයේ ගොනු කළ නඩුව සඳහා නීතිඥ සංජය දසනායක මහතා වෙතින් අවශ්‍ය නීතිඥ සේවා ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම නීතිඥ මහතාම කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය සම්බන්ධව සභාව මැදිහත් වී ඇති නඩුවට ද ඉදිරිපත් වන බවත්, මෙම නඩු සම්බන්ධව නීතිඥ මහතා මුණ ගැසී සාකච්ඡා කිරීම සඳහා මන්ත්‍රීවරුන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා දිය හැකි බවත්, මේ සඳහා මන්ත්‍රීවරු හතරදෙනෙකුට සහභාගි විය හැකි බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(පෙ.ව 11.28ට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

එම අවස්ථාව මන්ත්‍රීවරුන්ට ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දෙන මෙන් ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** ඃ- එකී යෝජනාවට අදාළව CA/Writ/622/2021 අංක දරණ ගිංතොට ප්ලයිවුඩ් ආයතනය විසින් අභියාචනාධිකරණයේ ගොනු කළ නඩුව සඳහා නීතිඥ සංජය දසනායක මහතා වෙතින් අවශ්‍ය නීතිඥ සේවා ලබා ගැනීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(පෙ.ව 11.30ට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදු විය.)

**14.** ගාල්ල, මාම්පිටිය, වයිනේරු කන්ද යන ලිපිනයේ පදිංචි ඩී.බන්දුසේන මහතාගේ නිවසට අනතුරුදායක ලෙස ඩී.එල්. මාලනී චන්ද්‍රලතා මහත්මියගේ ඉඩමේ ඇති කොස් ගස් දෙක සහ හික් ගස සභා අරමුදලෙන් කපා ඉවත් කිරීමටත්, මේ සඳහා යන වියදම ඩී.එල්. මාලනී චන්ද්‍රලතා මහත්මියගෙන් අයකර ගැනීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ අනතුරුදායක ගස් කැපීමට ගස් හිමිකරුවන් විසින් කටයුතු නොකිරීම නිසා මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** ඃ- එකී යෝජනාවට අදාළව ගාල්ල, මාම්පිටිය, වයිනේරු කන්ද යන ලිපිනයේ පදිංචි ඩී.බන්දුසේන මහතාගේ නිවසට අනතුරුදායක ලෙස ඩී.එල්. මාලනී චන්ද්‍රලතා මහත්මියගේ ඉඩමේ ඇති කොස් ගස් දෙක සහ හික් ගස සභා අරමුදලෙන් කපා ඉවත් කිරීමටත්, මේ සඳහා යන වියදම ඩී.එල්. මාලනී චන්ද්‍රලතා මහත්මියගෙන් අයකර ගැනීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**15.** උළුවිටිකේ, නාවින්න පාර, අට්ටික්කාගහ වත්ත යන ලිපිනයේ පදිංචි දමයන්ති ඊව්ලින් අබේසුන්දර මහත්මියගේ දේපළ වලට අනතුරුදායක ලෙස අසළ මාර්ගයේ පිහිටා ඇති ගස් සහා අරමුදලෙන් කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව උළුවිටිකේ, නාවින්න පාර, අට්ටික්කාගහ වත්ත යන ලිපිනයේ පදිංචි දමයන්ති ඊව්ලින් අබේසුන්දර මහත්මියගේ දේපළ වලට අනතුරුදායක ලෙස අසළ මාර්ගයේ පිහිටා ඇති ගස් සභා අරමුදලෙන් කපා ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(පෙ.ව 11.32ට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**16.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට අයත් ලබුදූව වෙළඳ සංකීර්ණයේ අංක 26 කඩ කාමරයේ බදු අයිතිය කෝදාගොඩ කන්ඩම්බි නොයෙල් මැග්නස් මහතා (ජා.හැ.අ. 681340661v) වෙතින් බෝගහගොඩ ශාන්ත කුමාර මහතා (ජා.හැ.අ. 198014700688) වෙත පැවරීම සඳහා කරන ලැබූ ඉල්ලීම අනුව දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ 2010-12-27 දිනැති හා දපපා/පපාකො/2010/01 අංක දරණ චක්‍රලේඛයේ 12වන වගන්තිය අනුව සිදු කිරීමත්, බදු අයිතිය පැවරීම් කටයුතු සිදු කිරීම සඳහා රු.100,000.00ක සාධාරණ මුදලක් සභාවට ලබා ගැනීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට අයත් ලබුදූව වෙළඳ සංකීර්ණයේ අංක 26 කඩ කාමරයේ බදු අයිතිය කෝදාගොඩ කන්ඩම්බි නොයෙල් මැග්නස් මහතා (ජා.හැ.අ. 681340661v) වෙතින් පිටබැද්දර විතානගේ වින්දයා චන්ද්‍රමාලි විතානගේ මහත්මිය (ජා.හැ.අ. 198652101287) වෙත පැවරීම සඳහා කරන ලැබූ ඉල්ලීම අනුව දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ 2010-12-27 දිනැති හා දපපා/පපාකො/2010/01 අංක දරණ චක්‍රලේඛයේ 12වන වගන්තිය අනුව සිදු කිරීමත්, බදු අයිතිය පැවරීම් කටයුතු සිදු කිරීම සඳහා රු.100,000.00ක සාධාරණ මුදලක් සභාවට ලබා ගැනීමටත් ලෙස මෙම යෝජනාව සඳහා සංශෝධනයක් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

එම සංශෝධනය ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී සංශෝධිත යෝජනාවට අදාළව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට අයත් ලබුදූව වෙළඳ සංකීර්ණයේ අංක 26 කඩ කාමරයේ බදු අයිතිය කෝදාගොඩ කන්ඩම්බි නොයෙල් මැග්නස් මහතා (ජා.හැ.අ. 681340661v) වෙතින් පිටබැද්දර විතානගේ වින්දයා චන්ද්‍රමාලි විතානගේ මහත්මිය (ජා.හැ.අ. 198652101287) වෙත පැවරීම සඳහා කරන ලැබූ ඉල්ලීම අනුව දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ 2010-12-27 දිනැති හා දපපා/පපාකො/2010/01 අංක දරණ චක්‍රලේඛයේ 12වන වගන්තිය අනුව සිදු කිරීමත්, බදු අයිතිය පැවරීම් කටයුතු සිදු කිරීම සඳහා රු.100,000.00ක සාධාරණ මුදලක් සභාවට ලබා ගැනීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**17.** නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021-07-08 දින අති විශේෂ ගැසට් පත්‍රයේ 2වන උපලේඛනය යටතේ පල කරන ලද සැලසුම් සහ සංවර්ධන කටයුතු සඳහා වන ගාස්තු අප ප්‍රාදේශීය සභාව මගින් අයකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021-07-08 දින අති විශේෂ ගැසට් පත්‍රයේ 2වන උපලේඛනය යටතේ පල කරන ලද සැලසුම් සහ සංවර්ධන කටයුතු සඳහා වන ගාස්තු අප ප්‍රාදේශීය සභාව මගින් අයකිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ විශේෂ යෝජනා (යථා පරිදි කල් දී නැති)**

**ඉ.විශේෂ 01.** හඬට ඉඩක් ව්‍යාපෘතිය යටතේ හෙල්ප් ඕ සංවිධානය විසින් වියදම් දරා නිර්මාණය කරන ලද ඊ සභා ජංගම දුරකථන යෙදවුම සඳහා මෘදුකාංගය යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා රු.5250.00ක ගාස්තුවක් ඇක්වසොෆ්ට් (පුද්) සමාගම වෙත මාසිකව ගෙවීමටත්, මීට අදාළව හෙල්ප් ඕ සංවිධානය සහ ඇක්වසොෆ්ට් (පුද්) සමාගම ආයතනය සමඟ ගිවිසුම් ගතවීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මෘදුකාංගය ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 10කට ආසන්න ප්‍රමාණයකට හඳුන්වා දී ඇති බවත්, මේ සඳහා 2022-03-21 වන දින ගිවිසුම්ගත විය යුතු බවට පළාත් පාලන කොමසාරිස්තුමා දැනුම් දී ඇති බවත්, ප්‍රාදේශීය සභාවෙන් ජනතාවට සිදුවිය යුතු සේවාවන් සම්බන්ධව පැමිණිලි සභාව වෙත යොමු කිරීම සඳහා මෙම මෘදුකාංගය භාවිතා කළ හැකි බවත්, මේ සඳහා රු.5250.00ක මුදලක් මාසිකව ගෙවීමට සිදුවන බවත්, මේ සඳහා වන ගිවිසුම පළාත් පාලන කොමසාරිස්තුමා විසින් සභාව වෙත යොමුකොට ඇති බවත්, මේ පිළිබඳව අනෙකුත් පළාත් පාලන ආයතන සමඟ සාකච්ඡා කොට සාමුහික තීන්දුවක් ලබා ගන්නා බවත්, මෙම මුදල ගෙවන කාලසීමාව දක්වා පමණක් මෙම සේවාව ලබාගත හැකි බවත්, සේවාව නිසි පරිදි නොලැබේ නම් මෙමගින් ඉවත් විය හැකි බවත්, නවීන තාක්ෂණය උපයෝගී කොට ගෙන බල ප්‍රදේශයේ ජනතාව සමග සභාවට සම්බන්ධ විය හැකි බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම මෘදුකාංගය තමාගේ දුරකථනය සඳහා ද ඩවුන්ලෝඩ්කොට ඇති බවත්, එමගින් ඡායාරූප සහිතව සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකියාවක් ඇති බවත්, අනතුරුදායක ගස් සම්බන්ධ පැමිණිලි, වීදි පහන් සම්බන්ධ පැමිණිලි මෙන්ම මාර්ග සම්බන්ධ පැමිණිලි ආදිය පිළිබඳව සභාව දැනුවත් කළ හැකි බවත් ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

**(පෙ.ව 11.40ට තේ පානය සඳහා සභාව කල් තබන ලද මහා සභා රැස්වීම පෙ.ව 11.55ට නැවත ආරම්භ කරන ලදී.)**

(පෙ.ව 11.45ට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදු විය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා**

**18.** 2021 ඔක්තෝම්බර් මස 15 වෙනි දින සභාවට මා ඉදිරිපත් කල යෝජනාව එදින මා සභාවට නොපැමිණි බැවින් 2021 නොවැම්බර් 17 ඉදිරිපත් කරනු ලදුව සභා සම්මත වී ඇත. එහෙත් 2021 දෙසැම්බර් 2022 ජනවාරි මහා සභා වලටද ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කොට නොමැති බැවින් ඒ සම්බන්ධව ගන්නා ලද තීරණ සභාගත කරන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාවලියේ විදුලිය ගැන, ආදාහනාගාරය ගැන, සහා ගොඩනැගිල්ල ගැන යෝජනා කොට ඇති බවත්, ප්‍රයෝජනයක් නැති යෝජනා තමා විසින් ඉදිරිපත්කොට නොමැති බවත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

උත්තර ලබාදිය හැකි යෝජනා සහ උත්තර සකස්කොට ලබාදිය යුතු යෝජනා ඇති බැවින් ලේකම්තුමා මුණ ගැසී ඒ සම්බන්ධව සාකච්ඡා කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

යෝජනාවක් ඉදිරිපත් කළ පසු ඊළඟ සභාවාරය වන විට එහි ප්‍රගතිය ලබාදිය යුතු බවත්, එසේ නොමැතිවිට යෝජනා ගොඩ ගැසීම සිදුවන බවත්, සභා යෝජනා සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම සභාපතිවරයාගේ වගකීමක් බවත් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව 2021 ඔක්තෝම්බර් මස 15 වෙනි දින සභාවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව එදින එතුමා සභාවට නොපැමිණි බැවින් 2021 නොවැම්බර් 17 ඉදිරිපත් කරනු ලදුව සභා සම්මත වී ඇත. එහෙත් 2021 දෙසැම්බර් 2022 ජනවාරි මහා සභා වලටද ගන්නා ලද ක්‍රියාමාර්ග ඉදිරිපත් කොට නොමැති බැවින් ඒ සම්බන්ධව ගන්නා ලද තීරණ සභාගත කරන මෙන් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**19.** මා විසින් සභාගත කරන ලද ආදාහනාගාරය ලංසු පිරිනැමීම පිළිබඳ විරෝධතා ලිපිය (2021.11.16) සහ 2021.09.17 මුදල් කමිටුවේදී මාගේ විරෝධතාවයට හේතු යන ලිපි දෙක සභා වාර්තාවට ඇතුලත් කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

මෙම ලිපි දෙක සභාගත කර ඇති බැවින් සභා වාර්තාවට ඇතුලත් කළ යුතු බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් කමිටුවේදී දක්වන ලද විරෝධතාවය කමිටු වාර්තාවේ සඳහන් කර ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම ගැටළුව සම්බන්ධව තමා විසින් උපදෙස් ඉල්ලා ඇති බවත්, මෙම ලිපි දෙක සභාගත කර ඇති බැවින් සභා වාර්තාවට ඇතුළත් කළයුතු බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාගත කරන ලද ආදාහනාගාරය ලංසු පිරිනැමීම පිළිබඳ විරෝධතා ලිපිය (2021.11.16) සහ 2021.09.17 මුදල් කමිටුවේදී මාගේ විරෝධතාවයට හේතු යන ලිපි දෙක සභා වාර්තාවට ඇතුලත් කරන ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**20.** කමිටු වාර්ථා යතුරු ලියනය කොට (ටයිප් සෙටින්) කමිටු සාමාජිකයන්ගේ අත්සන සඳහා ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කමිටු තීරණ ටයිප් සෙටින් කොට ලබා දීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කමිටු වාර්ථා යතුරු ලියනය කොට (ටයිප් සෙටින්) කමිටු සාමාජිකයන්ගේ අත්සන සඳහා ඉදිරිපත් කරන ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(ප.ව 12.10ට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**21.** යම් කමිටුවක් කැඳවීමේදී එදින සාකච්ඡාවට ගනු ලබන කරුණු පැහැදිලිව සඳහන්කොට ඉදිරිපත් කල යුතු යැයි යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව යම් කමිටුවක් කැඳවීමේදී එදින සාකච්ඡාවට ගනු ලබන කරුණු පැහැදිලිව සඳහන්කොට ඉදිරිපත් කල යුතු යැයි මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**22.** ආදායම් වියදම් වාර්ථාව විස්තරාත්මකව ඉදිරිපත් කල යුතු යැයි යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මීට පෙර සභාවාර වලදී විස්තරාත්මක ආදායම් වියදම් වාර්තා සභාව වෙත ලබාදී ඇති බවත්, අතිකාල දීමනා ගෙවීම් පිළිබඳව සහ ගෙවීම් පිළිබඳ වාර්තාද සභාව වෙත ලබාදී ඇති බවත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සභාවේ ඇති ඕනෑම ලියවිල්ලක් ඕනෑම මන්ත්‍රීවරයෙකුට පරීක්ෂා කිරීමට හැකියාවක් ඇති බවත්, සේවකයාගෙන් සේවකයාට ගෙවීම් කරන ලද අතිකාල දීමනා සම්බන්ධ විස්තර සභාගත කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත්, යම් අවශ්‍යතාවයක් ඇති ඕනෑම මන්ත්‍රීවරයෙකුට ලේකම්වරයා මුණ

ගැසීමෙන් අනතුරුව ලිපිගොනු පරීක්ෂා කිරීමේ හැකියාවක් ඇති බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ආදායම් වියදම් වාර්ථාව විස්තරාත්මකව ඉදිරිපත් කල යුතු යැයි මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**23.** බටුවන්තුඩාව හපුගල මාර්ගයේ මවුන්ට් කැල්වරි පෞද්ගලික අධ්‍යාපන ආයතනය ඉදිරිපිට විදුලි පහනක් සවි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව බටුවන්තුඩාව හපුගල මාර්ගයේ මවුන්ට් කැල්වරි පෞද්ගලික අධ්‍යාපන ආයතනය ඉදිරිපිට විදුලි පහනක් සවි කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා</u>**

**24.** අයවැයෙන් වැඩ ලක්ෂයක් වැඩසටහන යටතේ කොට්ඨාශ වලට වෙන් වූ මුදල් කොට්ඨාශ වල මූලික අවශ්‍යතාවයන් වලට වෙන් කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මුදල් ලැබෙන ආකාරය සම්බන්ධව තමාට ගැටළුවක් ඇති බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මේ පිළිබඳව විමසීම් කළවිට එම මුදල් ලැබී නොමැති බවට දැනුවත් කළ බවත්, මෙම වැඩසටහන මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත්කොට ඇති බවත්, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

රුපියල් ලක්ෂ තිහක ප්‍රතිපාදන එක් ග්‍රාමසේවා වසමකට අදියර හතරක් යටතේ වෙන් වන බවත්, ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා රුපියල් ලක්ෂ දොළහක්ද, යටිතල පහසුකම් හා මංමාවත් සංවර්ධනය කිරීම සඳහා රුපියල් ලක්ෂ දොළහක්ද, පරිසර සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ තුනක්ද, සමාජ සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ තුනක්ද, වන පරිදි එම මුදල් ලැබෙන බවත්, ඊට අමතරව එක් කොට්ඨාශයකට රුපියල් ලක්ෂ හතලිහක ප්‍රතිපාදන ලැබෙන බවත්, හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙකුට රුපියල් ලක්ෂ දෙසීයක ප්‍රතිපාදන වෙන්වන බවත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට රුපියල් ලක්ෂ දාහක ප්‍රතිපාදන වෙන්වන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව අයවැයෙන් වැඩ ලක්ෂයක් වැඩසටහන යටතේ කොට්ඨාශ වලට වෙන් වූ මුදල් කොට්ඨාශ වල මූලික අවශ්‍යතාවයන් වලට වෙන් කරන ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**25.** කරාපිටියේ මොඩර්න් හාඩ්වෙයාර් එක ළඟ සුනිල් රණවක මහතාගේ නිවස අසලින් ඇති කාණුව සකස්කිරීමේ වැඩ කටයුතු මෙතෙක් සිදුවී නැති බැවින් වැඩ ලක්ෂයේ වැඩසටහන යටතේ මෙම කාණුව සකස්කර දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සෑම කොට්ඨාශයක් සඳහාම රුපියල් ලක්ෂ තිහක පමණ ප්‍රතිපාදන සභා අරමුදලින් මේ දක්වා ලබා දී ඇති බැවින් මෙම සංවර්ධන කටයුත්ත සම්බන්ධව කොට්ඨාශය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරයා වෙත දැනුම් දෙන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කරාපිටියේ මොඩර්න් හාඩ්වෙයාර් එක ළඟ සුනිල් රණවක මහතාගේ නිවස අසලින් ඇති කාණුව සකස්කිරීමේ වැඩ කටයුතු මෙතෙක් සිදුවී නැති බැවින් වැඩ ලක්ෂයේ වැඩසටහන යටතේ මෙම කාණුව සකස්කර දෙන ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**26.** කළුගේවත්ත කපුහෙම්පල නුග බෝධිය අසල සිට කළුගේවත්ත හරහා තොටගොඩට වැටෙන මාර්ගයේ ඉතාමත් අබලන් වී ඇති බැවින් එම මාර්ගයට කාපට් හෝ කොන්ක්‍රීට් දමා සකස්කර දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කළුගේවත්ත කපුහෙම්පල නුග බෝධිය අසල සිට කළුගේවත්ත හරහා තොටගොඩට වැටෙන මාර්ගයේ ඉතාමත් අබලන් වී ඇති බැවින් එම මාර්ගයට කාපට් හෝ කොන්ක්‍රීට් දමා සකස්කර දෙන ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**27.** කපුහෙම්පල මාර්ගයේ සිට ඇල්හේන වත්ත හරහා ගොඩදූවට වැටෙන අතුරු මාර්ගය කොන්ක්‍රීට් හෝ කාපට් යොදා සකස්කර දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කපුහෙම්පල මාර්ගයේ සිට ඇල්හේන වත්ත හරහා ගොඩදූවට වැටෙන අතුරු මාර්ගය කොන්ක්‍රීට් හෝ කාපට් යොදා සකස්කර දෙන ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**28.** පත්තිනිගේ වත්තට දිවෙන මාර්ගය ඇතුලේ ඇති විදුලි කණු දෙකට විදුලි පහන් දෙකක් සවිකරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව පත්තිනිගේ වත්තට දිවෙන මාර්ගය ඇතුලේ ඇති විදුලි කණු දෙකට විදුලි පහන් දෙකක් සවිකරන ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

1997 වර්ෂයේදී බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ කම්කරුවෙකු ලෙස සේවයට එක් වූ යූ.ජී. අමරදාස මහතා 2003 වර්ෂයේදී ස්ථිර සේවයට එක් වී 2016 වර්ෂයේදී විශ්‍රාම ගොස් ඇති නමුත් මේ දක්වා විශ්‍රාම වැටුප නොලැබී ඇති බැවින් තමා විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව විමසූ විට මෙම මහතා හට විශ්‍රාම වැටුප ගෙවීම් කිරීම සිදුකළ නොහැකි බවට දැනුම් දුන් බැවින් මේ පිළිබඳව සොයා බලන ලෙස ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

යූ.ජී. අමරදාස මහතාගේ විශ්‍රාම වැටුප ලබාදීම සඳහා වරින් වර අඩුපාඩු ලෙස දන්වා එවන ලද සියළුම ලියකියවිලි සභාව මගින් ලබා දී ඇති බවත්, පුරප්පාඩු රහිත අවස්ථාවක ස්ථිර පත්වීම ලබාදී ඇති බැවින් මෙම මහතා හට විශ්‍රාම වැටුප ගෙවීම සිදුකළ නොහැකි බවට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් දැනුම් දී ඇති බැවින් මෙම ගැටළුව පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට ගරු වැවිලි අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා වෙත භාර දී ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**29.** ජස්ටින් කන්ද පැල්පොලවත්ත මාර්ගය මැද ගමනාගමනයට බාධාවන අයුරින් පිහිටා ඇති කළුගල සහා අරමුදලින් රසායනික ද්‍රව්‍ය යොදා කුළුගෙඩි ගසා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ః-** එකී යෝජනාවට අදාළව ජස්ටින් කන්ද පැල්පොලවත්ත මාර්ගය මැද ගමනාගමනයට බාධාවන අයුරින් පිහිටා ඇති කළුගල සහා අරමුදලින් රසායනික ද්‍රව්‍ය යොදා කුළුගෙඩි ගසා ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**30.** දීර්ඝකාලීන ගැටළු පවතින පහත සඳහන් ජනතා ගැටළුවලට විශාල මුදලක් වැයවන බැවින් අවුරුදු දහයක කාලයක සිට ජනතාව ඉල්ලීම් ඉදිරිපත් කලද සභාවක් ලෙස විසඳුම් ලබාදීමට නොහැකිව ඇත. එබැවින් පහත ගැටළු සඳහා විසඳුම් ලබාදීමට ඇස්තමේන්තු සකසා පළාත් පාලන අමාත්‍යවරයාගෙන් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

I. හිරිඹුර ටොරින්ටන් සිට ගැමුණු මාවත ජලය බැසයන කාණුව
II. ජස්ටින් කන්ද උළුවිටිකේ පැති කාණුව
III. ජස්ටින් කන්දෙ කරාපිටිය පැති කාණුව
IV. මොඩර්න් හාඩ්වෙයාර් අසළ කාණුව
V. පැතුම් උයන පැති කාණුව
VI. ගොඩකන්ද විවේකාරාම පාරේ පැති කාණුව

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ః-** එකී යෝජනාවට අදාළව දීර්ඝකාලීන ගැටළු පවතින පහත සඳහන් ජනතා ගැටළුවලට විශාල මුදලක් වැයවන බැවින් අවුරුදු දහයක කාලයක සිට ජනතාව ඉල්ලීම් ඉදිරිපත් කලද සභාවක් ලෙස විසඳුම් ලබාදීමට නොහැකිව ඇත. එබැවින් පහත ගැටළු සඳහා විසඳුම් ලබාදීමට ඇස්තමේන්තු සකසා පළාත් පාලන අමාත්‍යවරයාගෙන් ඉල්ලා යැවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

I. හිරිඹුර ටොරින්ටන් සිට ගැමුණු මාවත ජලය බැසයන කාණුව
II. ජස්ටින් කන්ද උළුවිටිකේ පැති කාණුව
III. ජස්ටින් කන්දෙ කරාපිටිය පැති කාණුව
IV. මොඩර්න් හාඩ්වෙයාර් අසළ කාණුව
V. පැතුම් උයන පැති කාණුව
VI. ගොඩකන්ද විවේකාරාම පාරේ පැති කාණුව

**31.** කළුවගහඅද්දර ජනතා ගැටළු රැසක් නිර්මාණය කර ඇති අනවසරයෙන් කැබලි කරන ලද ඉඩමේ මාර්ග අවහිරතාවයන් ජලය බැසයන කාණු ඉඩම් මායිම් මාර්ගයට නිවරදිව වෙන්කර දෙන තෙක් ලබා දෙන ලද අනුමැතියකින් තහනම් කිරීමටත් ඒ පිළිබඳව අදාළ ආයතනයන් දැනුවත් කිරීමටත් අනුමැතිය ලබා දෙන ලද ඉඩම් වල වාර්තාවක් සභාගත කරන ලෙසත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ః-** එකී යෝජනාවට අදාළව කළුවගහඅද්දර ජනතා ගැටළු රැසක් නිර්මාණය කර ඇති අනවසරයෙන් කැබලිකරන ලද ඉඩමේ මාර්ග අවහිරතාවයන් ජලය බැසයන කාණු ඉඩම් මායිම් මාර්ගයට නිවරදිව වෙන්කර දෙන තෙක් ලබා දෙන ලද අනුමැතියකින් තහනම් කිරීමටත් ඒ පිළිබඳව අදාළ ආයතනයන් දැනුවත් කිරීමටත් අනුමැතිය ලබා දෙන ලද ඉඩම් වල වාර්තාවක් සභාගත කරන ලෙසත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**32.** දිවා කාලය තුළ දැල්වෙන වීදි පහන් වල කෙටි කාලයකට බල්බය ගලවාගෙන ඒමට හෝ විදුලිය විසන්ධි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව දිවා කාලය තුළ දැල්වෙන වීදි පහන් වල කෙටි කාලයකට බල්බය ගලවාගෙන ඒමට හෝ විදුලිය විසන්ධි කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**33.** දෙණියවත්ත නොහොත් කහටගහවත්ත නිවාස හයකට ගමන් කිරීමට සුදුසු ස්ථානයකින් ඉඩම් අත්පත්කරගෙන මාර්ගයක් සකසාදීමටත් මේ සඳහා වැයවන සියළුම වියදම් එම මාර්ගය භාවිතා කරන නිවාස හිමියන්ගෙන් අයකර ගැනීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව දෙණියවත්ත නොහොත් කහටගහවත්ත නිවාස හයකට ගමන් කිරීමට සුදුසු ස්ථානයකින් ඉඩම් අත්පත්කරගෙන මාර්ගයක් සකසාදීමටත් මේ සඳහා වැයවන සියළුම වියදම් එම මාර්ගය භාවිතා කරන නිවාස හිමියන්ගෙන් අයකර ගැනීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**34.** ගුරුදෙවලවත්ත, චමින්ද මහතාගේ නිවස අසළ මාර්ගයේ අනතුරුදායක ලෙස පිහිටා ඇති දිරාගිය කොස් ගස් දෙක කපා වෙන්දේසිකර විකිණීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ගුරුදෙවලවත්ත, චමින්ද මහතාගේ නිවස අසළ මාර්ගයේ අනතුරුදායක ලෙස පිහිටා ඇති දිරාගිය කොස් ගස් දෙක කපා වෙන්දේසිකර විකිණීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**35.** නරාවල, පන්විල පොඩි කඩය අසලින් මුලන දෙසට ඇති මාර්ගයේ ජල සැපයුම ලබා දීම සඳහා පොදු ජල නලය එලීමට මාර්ගය පළුදු කිරීමට සිදුවන අතර ඒ සඳහා සභාවට ගෙවීමට ඇති මුදල නිදහස් කර දෙන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව නරාවල, පන්විල පොඩි කඩය අසලින් මුලන දෙසට ඇති මාර්ගයේ ජල සැපයුම ලබා දීම සඳහා පොදු ජල නලය එලීමට මාර්ගය පළුදු කිරීමට සිදුවන අතර ඒ සඳහා සභාවට ගෙවීමට ඇති මුදල නිදහස් කර දෙන මෙන් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(ප.ව 12.45ට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදු විය.)

**<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**36.** පැලවත්ත, අපේගම ප්‍රධාන පාරේ සිරිල් ගාල්ලගේ මහතාගේ කඩය අසළ කාණුව කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව පැලවත්ත, අපේගම ප්‍රධාන පාරේ සිරිල් ගාල්ලගේ මහතාගේ කඩය අසළ කාණුව කොන්ක්‍රීට් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**37.** ආනන්ද මාවත, පලාගල කන්දට හැරෙන ස්ථානයේ සිලින්ඩරය කැඩී ඇති බැවින් එම ස්ථානයට අලුතෙන් සිලින්ඩර් යෙදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ආනන්ද මාවත, පලාගල කන්දට හැරෙන ස්ථානයේ සිලින්ඩරය කැඩී ඇති බැවින් එම ස්ථානයට අලුතෙන් සිලින්ඩර් යෙදීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**38.** ගෝනකොල දෙණිය සහ නාගහකන්ද මාර්ගයේ පළමු පටුමග එකතුවන ස්ථානයට අඩි එකහමාරක විශ්කම්භය ඇති අඩි අටක් දිග සිලින්ඩරයක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ගෝනකොල දෙණිය සහ නාගහකන්ද මාර්ගයේ පළමු පටුමග එකතුවන ස්ථානයට අඩි එකහමාරක විශ්කම්භය ඇති අඩි අටක් දිග සිලින්ඩරයක් යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

පසුගිය දිනයකදී ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණියගේ ස්වාමිපුරුෂයා වියෝවූ බැවින් ඒ සඳහා ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු සියළුම ගරු සභිකරුන්ගේ මෙන්ම, ලේකම්තුමා ඇතුළු සියළුම නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ ශෝකය මෙම අවස්ථාවේදී ප්‍රකාශ කරන බවට ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

2021-12-11 වන දින රිය අනතුරකට ලක්වී මාස දෙක හමාරක පමණ කාලයක් රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිටින අතරතුරදී අභාවයට පත් ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණියගේ ස්වාමිපුරුෂාගේ අවමංගල්‍ය උත්සවයට සහභාගි වූ සහ එම රිය අනතුර සිදුවූ දින සිට සහයෝගය දැක්වූ සහ ඒ සම්බන්ධව සොයා බැලූ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු සියළුම ගරු සභිකරුන්ටත්, ලේකම්තුමා ඇතුළු සියළුම නිලධාරීන් සහ සේවකයන්ටත් ගෞරවණීය ස්තුතිය පුදකරනු ලබන බවට ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය විසින් ලබා දුන් ස්තුතිය ප්‍රකාශ කරන ලද ලිපිය ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් වීම පිණිස කියවන ලදී.

**<u>ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමාගේ යෝජනා</u>**

**39.** වැලිකැටියවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

වැලිකැටියවත්ත මාර්ගයේ පැති බැම්මද කඩිනමින් සංවර්ධනය කරදෙන ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව වැලිකැටියවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**40.** ලබුදූව වෙළඳ සංකීර්ණය ඉදිරිපස මැදින් පඩිපෙලක් යෙදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කාර්යය සිදුකිරීම සඳහා තමා විසින් මීට පෙර උත්සාහයක් ගත් නමුත් වෙළඳ සංකීර්ණයේ මැද පිහිටා ඇති වෙළඳසැල අවහිර වන බැවින් එම කාර්යය සිදුකිරීමට බාධාවක් ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ලබුදූව වෙළඳ සංකීර්ණය ඉදිරිපස මැදින් පඩිපෙලක් යෙදීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>**

**41.** ඇලබඩ, කෝන්ගහ වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාවේ සේවය කොට විශ්‍රාම යන ලද බී.කේ. සරත් මහතාගේ ඉල්ලීමක් අනුව මෙම ඉදිරිපත් කළ බවත්, සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය යොදාගෙන මෙම මාර්ගය සංවර්ධනය කරදෙන මෙන් ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව ඇලබඩ, කෝන්ගහ වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ යෝජනා</u>**

**42.** සිල්වගේවත්ත පාසල අසළ ඩිලාන් රංග මහතාගේ නිවස ඇතුළු තවත් නිවාස 05කට පමණ ඇති අතුරු මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව සිල්වගේවත්ත පාසල අසළ ඩිලාන් රංග මහතාගේ නිවස ඇතුළු තවත් නිවාස 05කට පමණ ඇති අතුරු මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**43.** සිට්ට්‍රස් වත්ත ජනපදයේ පදිංචිවාසීන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙත සෘජුව ලිපි ලැබීම නිසියාකාරව සිදු නොවන බැවින් ඒ සඳහා විධිමත් ක්‍රමවේදයන් සකස් කිරීම සඳහා ගාල්ල තැපැල් අධිකාරි දැනුවත් කිරීම සඳහා මැදිහත්වන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

හපුගල, බටුවන්තුඩාව, පිලාන කඩේ ඇතුල් පාරේ ලිපි බෙදීම සඳහා තැපැල්කරුවෙක් නොමැති බැවින් ඒ අවට ප්‍රදේශවාසීන්ට ලිපි ලැබීමේ ගැටළුවක් ඇති බවට ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ගැටළුව පිළිබඳව ගාල්ල තැපැල් අධිකාරි දැනුවත් කොට විසඳුම් ලබාදෙන ලෙස ඉල්ලීම් කරන ලෙසත්, සිට්ට්‍රස් වතුයායේ පදිංචිකරුවන්ට ලැබෙන ලිපි වතුයායේ කාර්යාලයට ලබාදී යන බවත්, හදිසි ලිපියක් වුවද ප්‍රදේශවාසීන් පැමිණ විමසීම් නොකරන්නේ නම් නොලැබෙන බවත්, තැපැල් මුද්දර අලවා පිරිවැයක් දරා ලිපි තැපැල් කරන බැවින් ඒ සම්බන්ධව තැපැල් දෙපාර්තමේන්තුව වෙත වගකීමක් ඇති බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව ගමේ පදිංචිකරුවන් විසින් ලිපියක් අත්සන්කොට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත්කොට ඇති බවත්, වතුයායේ කාර්යාලයට ලිපි භාර නොගන්නා ලෙස ඉල්ලීමක් කරන ලෙසත්, ලිපිය අයිතිකරුට භාර දිය නොහැකි නම් නැවත තැපැල් කාර්යාලය වෙත යැවිය යුතු බවට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ගැටළුව පිළිබඳව ගමේ පදිංචිකරුවන් සමග සාකච්ඡා කළ යුතු බවත්, දිවා කාලයේදී තැපැල්කරු ලිපි බෙදීම සඳහා නිවාස වලට යනවිට ලිපි භාර ගැනීමට කෙනෙකු නොමැතිවීම නිසා ලිපි වතුයායේ කාර්යාලයට ලබාදීම සිදුකරන බවත්, දෙමාපියන් රැකියාව සඳහා පිටත්ව යන බවත්, ළමුන් පාසල් යන බවත්, එබැවින් දිවා කාලයේදී නිවාසවල ලිපි භාර ගැනීමට කෙනෙකු නොමැති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම කාරණය ප්‍රායෝගික ගැටළුවක් බවත්, මේ සම්බන්ධව තැපැල් දෙපාර්තමේන්තුවට වගකීමක් ඇති බවත්, පැමිණිලි ලබාදී ඇති බැවින් මේ සම්බන්ධව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී පවා සාකච්ඡා කොට ඇති බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සමහර වතුවල කාර්යාලයට ලැබෙන ලිපි කැඩීමෙන් පසු එය කියවා බලා සේවකයන්හට ලබා දීමට කටයුතු කරන බැවින් වතු කාර්යාලයට ලිපි ලබාදීමට කටයුතු කරන බවත්, වතුවල වෙනම උප සංස්කෘතියක් ඇති බවත්, පිටස්තර පුද්ගලයෙකු පැමිණ වතුයායේ පිහිටි නිවසක නවතින්නේ නම් ඒ පිළිබඳව කාර්යාලයට දැනුම් දී ලියාපදිංචි කිරීමෙන් පසු නවාතැන්ගත යුතු බවත්, වතුයායෙන් පිටවන විට කාර්යාලය දැනුවත්කොට පිටවීම සිදුකළ යුතු බවත්, වතු අධිකාරි සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව මෙම ගැටළුව සම්බන්ධව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවටත් ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සිට්ට්‍රස්වත්තේ ඇත්තේ ලැයිම් කාමර නොවන බවත්, එම ගෙවල් පදිංචිය සඳහා ලබා දී ඇති බවත්, එම පුද්ගලයන්හට පෞද්ගලික ලිපිනයන් ඇති බවත්, පෞද්ගලික ලිපිනයට ලැබෙන ලිපි වතුයායේ කාර්යාලයට ලබාදීම තැපැල් කාර්යාලයේ වගකීම නොවන බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ගැටළුව සම්බන්ධව වතු අධිකාරිවරයා සමග සහ පදිංචිකරුවන් සමග සාකච්ඡාකොට තීරණයක් ලබා ගත යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මිනිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් තමා කතා කරන බවත්, පරිපාලන ක්‍රමවේදය පිළිබඳව මෙහි ගැටළුවක් නොමැති බවත්, මිනිසුන්ගේ අයිතිය උල්ලංඝනය වී ඇති බැවින් ඒ අයිතිය වෙනුවෙන් තමා පෙනී සිටින බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කුරුන්ද කන්ද ප්‍රදේශයේද මෙම ගැටළුව ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ප්‍රායෝගික ප්‍රශ්න තිබුණද මෙම යෝජනාව මිනිසුන්ගේ පැත්තෙන් ක්‍රියාත්මක කළ යුතු බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** ඃ- එකී යෝජනාවට අදාළව සිට්ට්‍රස් වත්ත ජනපදයේ පදිංචිවාසීන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙත සෘජුව ලිපි ලැබීම නිසියාකාරව සිදු නොවන බැවින් ඒ සඳහා විධිමත් ක්‍රමවේදයන් සකස් කිරීම සඳහා ගාල්ල තැපැල් අධිකාරි දැනුවත් කිරීම සඳහා මැදිහත්වන ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**44.** සිට්ට්‍රස් වත්ත ජනපදවාසීන් සඳහා පානීය ජල පහසුකම් සඳහා නල ජලය ලබාදීමට ජල සම්පාදන මණ්ඩලයට යෝජනා කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** ඃ- එකී යෝජනාවට අදාළව සිට්ට්‍රස් වත්ත ජනපදවාසීන් සඳහා පානීය ජල පහසුකම් සඳහා නල ජලය ලබාදීමට ජල සම්පාදන මණ්ඩලයට යෝජනා කරන මෙන් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**45.** මාර්ග සංවර්ධන කටයුතු වලදී මාර්ග දෙපස සහ කාණු පද්ධති නිසි පරිදි සම්පූර්ණ නොවීම හේතුවෙන් මාර්ග ඉක්මණින්ම අබලන්වීම සහ අනතුරුදායක තත්ත්වයන් වැළැක්වීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර අධීක්ෂණ කටයුතු සඳහා සභාව මැදිහත්වන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව මීට පෙරද ඉදිරිපත්කොට ඇති බවත්, සමහර මාර්ගයන්වල සංවර්ධන කටයුතු සිදු කිරීමෙන් පසු මාර්ග දෙපස බෑවුම් ස්වාභාවයේ වැඩිවීම නිසා වර්ෂාව සහිත කාලයේදී මාර්ග දෙපස සෝදා පාළුවට ලක්වන බවත්, එම නිසා නැවත ප්‍රශ්න ගණනාවක් පැන නගින බවත්, මවුන්ට් ප්ලසන්ට් වත්තේ කාණු පිළිබඳව තමා විසින් දිගින් දිගට සභාවේදී මතු කළේ එම කාණු ධාරිතාවයට ඔරොත්තු නොදෙන නිසා බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම ආයතන වලට සභාව ලෙස අප ආයතනයට අභියෝග කළ නොහැකි බවත්, එම සංවර්ධන වැඩ කටයුතුවල ගැටළු හෝ අඩුපාඩු ඇත්නම් ඒවා පෙන්වාදීම සිදුකළ හැකි බවත්, සභාවේ තාක්ෂණ නිලධාරීන්ට

එම කාර්යයන් අධීක්ෂණය කිරීම සිදුකළ නොහැකි බවත් බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

තාක්ෂණික දැනුම ඇත්තේ තාක්ෂණ නිලධාරීන්ට බැවින් මේ සඳහා මැදිහත්වන ලෙස ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව මාර්ග සංවර්ධන කටයුතු වලදී මාර්ග දෙපස සහ කාණු පද්ධති නිසි පරිදි සම්පූර්ණ නොවීම හේතුවෙන් මාර්ග ඉක්මණින්ම අබලන්වීම සහ අනතුරුදායක තත්ත්වයන් වැලැක්වීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර අධීක්ෂණ කටයුතු සඳහා සභාව මැදිහත්වන ලෙස මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඃ-</u>**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ඃ-**

**I.** 2022-02-17 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කමිටු වාර්තාවල තමා පෙන්වාදුන් අඩුපාඩු නිවැරදි වනතෙක් කමිටු වාර්තාවලට තමා විරුද්ධ බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම වාර්තාව බහුතරයෙන් සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-**

**I.** 2022-02-17 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ-**

**I.** 2022-02-10 දින පැවති නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ-**

**I.** 2022-02-10 දින පැවති පරිසරය සහ පහසුකම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

**<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

2022 වර්ෂයේ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

I. 2022 වර්ෂයේ ජනවාරි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

II. 2022 වර්ෂයේ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

(ප.ව 01.00ට ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා, ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා සහ ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**04. වෙනත් ලේඛන ඃ-**

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**2022 වර්ෂයේ පෙබරවාරි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.**

ස්වයංක්‍රීය මුදල් ලබා ගැනීමේ යන්ත්‍රයක් සවි කිරීම සඳහා සභා භූමියේ ඉඩ ලබා දී ඇති බැවින් ඒ සඳහා මාසික බදු මුදලක් අය කරන්නේද යනුවෙන් ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

ඒ සඳහා මාසික බදු මුදලක් අයවන බවත්, එය සේවාවක් ලෙස අනුමැතිය ලබා දුන්නද එමගින් මාසික බදු මුදලක් සභාවට ලැබෙන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා වෙත නිවාඩු අනුමත කිරීම සඳහා කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඩෙංගු මදුරුවන් බෝවීම පිළිබඳව සෙවීම සඳහා මේ දිනවල මහජන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු කටයුතු කරන බවත්, තම නිවස ආසන්නයේ අනවසර ගොඩකිරීමක් නිසා සහ කාණුවක් බැඳීම නිසා ඩෙංගු මදුරුවන් බෝවීමේ ගැටළුවක් ඇති බවත්, මේ පිළිබඳව තමාට පොලීසියේ පැමිණිල්ලක් දැමීමට සිදු වී ඇති බවත්, එම කාණුව බැඳීම නිසා ඩෙංගු මදුරුවන් බෝවන බවත්, සභාවේ කිසිදු අවසරයකින් තොරව එම කාර්යය සිදුකොට ඇති බවත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(ප.ව 01.05 ට ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

පහත්බිම් ගොඩකිරීම් මණ්ඩලය හරහා මේ සඳහා නිර්දේශ ලබාගෙන ඇති බවත්, එහි සභාව දැනුවත් කොට අදාළ කාර්යයන් සිදුකරන ලෙස දැනුම් දී ඇති බවත්, නමුත් කාණුව ඉදිකිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍යතාවයක් නොමැති බවට සැලසුම් කමිටුව දැනුම් දී ඇති බවත්, මෙම ගැටළුව සඳහා විසඳුමක් ලබා දෙන ලෙසත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එන්.බී.ආර්.ඕ වාර්තාවල සභාවේ තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ කාර්යයන් සිදු කරන ලෙස දැනුම් දීම සිදුකළද එය එසේ සිදු නොවන බවත්, පූජානි මහත්මියගේ තාප්පයේ ගැටළුව සඳහා විසඳුම් ලබා දෙන ලෙසත්, මවුන්ට් ප්ලසන්ට් වත්තේ අවිධිමත් ලෙස කණ්ඩියක් කපන බැවින් ඒ පිළිබඳව සොයා බලන ලෙසත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(ප.ව 01.15ට ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

හෝළුවාගොඩ සංවර්ධන ව්‍යාපෘතියේ සැලසුම් සහ ඇස්තමේන්තු සභාගත කරන ලෙස ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සහ ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් කරන ලද යෝජනා වලට අනුව ඊට අදාළ සැලසුම් සහ ඇස්තමේන්තුවල පිටපත් ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් අප ප්‍රාදේශීය සභාව වෙත ලබාදී ඇති බවත්, එම ව්‍යාපෘතියේ සැලසුම් සහ ඇස්තමේන්තු සභාගත කරන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ලැන්දෑව හන්දියේ ඇති මහාබෝධි සමාගම සතු ඉඩම සභාවට පවරාගැනීමට අදාළව මේ වන විට ඇති තත්ත්වය සභාව දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

මෙම මහාබෝධි සමාගමේ සභාපතිහිමි වන භානගල උපතිස්ස ස්වාමීන් වහන්සේව තමා විසින් මෙම කාර්යය සඳහා මුණ ගැසුණ බවත්, එම ස්වාමීන්වහන්සේ විසින් මෙම ඉඩම පිහිටි ස්ථානය පිළිබඳව නොදන්නා බවත්, මහාබෝධි සමාගමේ ගාල්ල දිස්ත්‍රික් නියෝජිතවරයා හට මෙම ඉඩම පිළිබඳ විස්තර ලබාදී ඇති බවට දැනුම් දුන් බවත්, මෙම ඉඩම සභාවට ලබා ගැනීම සඳහා මැනුම් කටයුතු සූදානම් කළ ද ඒ ඉඩම ආසන්නයේ ඇති නිවසේ පදිංචිකරුවන් විසින් ඒ සඳහා විරෝධය පළ කළ බවත්, මහාබෝධි සමාගමේ ගාල්ල දිස්ත්‍රික් නියෝජිතවරයා විසින් මෙම ඉඩම ඔහුගේ නමට ලියාගෙන ඇති බවට තමාට දැන ගන්නට ලැබුණ බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙය වංචාවක් බැවින් මේ පිළිබඳව පොලීසිය දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

මෙම ඉඩම සභාවට ලබා ගැනීම සඳහා තක්සේරුවක් ලබා දෙන ලෙස ඉල්ලීම් කළ බවත්, මෙම ස්ථානයේ කඩිනමින් සති පොළ ආරම්භ කළ යුතු බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සභාවේ ඇති ටකරන් සහ ශීට් යොදාගෙන සතිපොළ ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළ යුතු බවට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සිරාස් මහතාගේ ගැටළුව පිළිබඳව සභාව දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

(ප.ව 01.20ට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

මේ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය මගින් ලිපියක් යොමුකොට ඇති බවත්, එබැවින් මේ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුම් දී ඇති බවත්, එම නිසා නීතිඥ හේමන්ත විතාරණ මහතා වෙත එම ලිපිගොනුව භාර දී ඒ පිළිබඳව කරුණු සොයා බැලීමට ලබාදුන් බවත්, එම ඉඩමේ පර්චස් 12ක් විකුණා ඇති බවට නීතිඥ හේමන්ත විතාරණ මහතා විසින් දැනුම් දුන් බවත්, එම නිසා ඒ පිළිබඳව වාර්තාවක් ලබා දෙන ලෙස තමා විසින් නීතිඥ හේමන්ත විතාරණ මහතා වෙත දැනුම් දුන් බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(ප.ව 01.25 ට ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

හඬට ඉඩක් වැඩසටහන යටතේ තමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුව පන් ආශ්‍රිත නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවස්ථාව හමුවූ බවත්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙසෙන අඩු ආදායම්ලාභීන් හෝ පන් ආශ්‍රිත නිෂ්පාදන කටයුතුවලට කැමති කාන්තාවන් හෝ පනස්දෙනෙකු මූලික වටයෙන් තෝරාගත හැකි බවත්, චතුර වැලිවිටිය මහතාගේ මූලිකත්වයෙන් එම කටයුතු සිදුවන බවත්, සභාව සම්බන්ධ කරගෙන එම කටයුත්ත ඉදිරියට ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත්, ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණියගේ ස්වාමිපුරුෂයාගේ අවමංගල්‍ය උත්සවයට තමාට සහභාගි වීමට නොහැකි වූයේ තමා ඇතුළු පවුලේ සැමට කොරෝනා රෝගය වැලඳීම නිසා බවත්, මේ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමියට තමාගේ කණගාටුව සහ ශෝකය ප්‍රකාශ කරන බවත්, කොරෝනා රෝගය වැලඳීම නිසා තමා හට පසුගිය මහා සභා රැස්වීමටද සහභාගි වීමට නොහැකි වූ බවත්, ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

(ප.ව 01.30 ට ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

උක්වත්තේ පස් කණ්ඩියක් නායයෑම පිළිබඳව පසුගිය සභා වාරයේදී ඉදිරිපත් වූ යෝජනාවට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව සභාව දැනුවත් කරන ලෙස ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

(ප.ව 01.35ට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

ඒ සඳහා තමා විසින් ලිඛිත අවසරයක් සහ විරෝධතා නොමැති බවට දැනුම් දුන් බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු :-**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා

**සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**

මීළඟ මහා සභා රැස්වීම 2022-04-07 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීමේ කටයුතු ප.ව 01.40ට අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.